# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 අප්‍රේල් මස 18 වන දින

II වන කොටස

අතිරේකය

(2019.04.24 දින නිකුත් කරන ලදී)

# මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන)

1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි

නාගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

### නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන හා 3 වන වගන්ති* : මෙම වගන්ති මඟින්, (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරන ලබන) 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත සහ වෙනත් ලිඛිත නීති සංශෝධනය කරනු ලබා අතර, සංශෝධනවල නීතිය බලපෑම වනුයේ-

(අ) "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" යන වචන වෙනුවට "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" යන වචන ; සහ

(ආ) "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන වචන වෙනුවට "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන වචන,

ආදේශ කිරීම වේ.

*4 වන වගන්තිය* : මෙම වගන්තිය මඟින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ එම වගන්තිය අදළවීම අරමුදලේ භාරකරුවන්ට ද ව්‍යාප්ත කිරීම වේ.

*5 වන වගන්තිය* : මෙම වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට 15අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ අරමුදලේ දේපළ කෙරෙහි 1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනතේ විධිවිධාන අදළ කරවීම වේ.

*6 වන වගන්තිය* : මෙම වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ "වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයා" යන වචන වෙනුවට "උසස් අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා" යන වචන ආදේශ කිරීම වේ.

*7 වන වගන්තිය* :මෙම වගන්තියේ විධිවිධානවලට 2 වන හා 3 වන වගන්ති මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

# මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන)

එල්.ඩී.— ඕ. 58/2018

**1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2019 අංක  දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1981 අංක 66 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.*

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනතේ දීර්ඝ නාමය එහි "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන වචන වෙනුවට "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියට සහ වෙනත් ලිඛිත නීතිවලට කරනු ලබන පොදු සංශෝධන.*

3. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක-

(අ) "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" යන වචන; සහ

(ආ) "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යන වචන,

ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් දැන්වීමක, නිවේදනයක, විසුමක, සන්නිවේදනයක, එකඟතාවයක, ආකෘති පත්‍රයක හෝ වෙනත් යම් ලේඛනයක "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" සහ

"මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යනුවෙන් සඳහන් කර ඇති සෑම අවස්ථාවක දී ම "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත" සහ "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" යනුවෙන් කරන ලද සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම්ගත යුතු ය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ "අරමුදලේ සියලු නිලධරයන් හා සේවකයන්" යන වචන වෙනුවට "අරමුදලේ සියලු නිලධරයන්, සේවකයන් සහ භාරකරුවන්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 15අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියට 15අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනතේ විධිවිධාන අදාළ විය යුතු බව.

15අ. අරමුදලේ සියලුම චංචල සහ නිශ්චල දේපළ, 1982 අංක 12 දරන පොදු දේපළ විෂයයෙහි ලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා පොදු දේපළ ලෙස සලකනු ලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ "වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයා" යන වචන වෙනුවට "උසස් අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. සැක දුරුකිරීම සඳහා, "ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල" සියලු කාර්ය සඳහා "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ" අනුප්‍රාප්තිකයා ලෙස සලකනු ලැබිය යුතු බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

සැක දුරු කිරීම.

8. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.